# ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
# කොළඹ

## පුවත්පත් නිවේදනය

## <u>ගුරුදේව් රවින්ද්‍රනාත් තාගෝර්තුමාගේ 164 වන ජන්ම සංවත්සරය සැමරේ</u>

කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය නොබෙල් සම්මානලාභී කවියකු, දාර්ශනිකයකු සහ චින්තකයකු වන ගුරුදේව් රවින්ද්‍රනාත් තාගෝර්තුමාගේ 164 වන ජන්ම සංවත්සරය නිමිත්තෙන් 2025 මැයි 8 වන දින උත්සවයක් සංවිධානය කර තිබිණ.

2. ප්‍රවීණ අධ්‍යාපනඥයකු සහ සංස්කෘතික විචාරකයකු වන ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතාගේ හරවත් දේශනයක් සමඟින් උත්සවය සමාරම්භ විය. එතුමා සිය දේශනයේ දී තාගෝර්තුමාගේ මානුෂීය පරමාදර්ශයන් හි අදාළත්වය සහ එතුමාගේ නිර්මාණශීලී චින්තනයේ විශ්වීයත්වය පිළිබඳව විස්තර කළේය. තාගෝර්තුමාගේ දර්ශනය සහ කලාපය විසින් බදො හදා ගන්නා සංස්කෘතික උරුමය අතර සබඳතා ගෙන හැර දක්වමින් අභයසුන්දර මහතා තාගෝර්තුමාගේ චින්තනය දේශ සීමාවන්ට ඔබ්බෙන් ද විහිදී යන උදාර චින්තනයක් බව ප්‍රකාශ කළේය.

3. මෙම සන්ධ්‍යාව ශ්‍රී ලාංකීය සහ ඉන්දීය කලාකරුවන් විසින් ඉදිරිපත් කරන ලද සුමධුර ගීතයන්ගෙන් සහ මනරම් නර්තනාංගයන්ගෙන් ද විචිත්‍රවත් විය. ශාස්ත්‍රපති අසිත් අතපත්තු, ශාස්ත්‍රපති පාලින්ද උඩවලෙආරච්චි සහ ජයන්ති රේ යන මහත්ම මහත්මීන් සහ ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ සිසු සිසුවියන් විසින් තාගෝර්තුමාගේ කලා කෞශල්‍යය සහ ආධ්‍යාත්මික ගැඹුර පිළිබිඹු කරමින් සිදු කළ ඉදිරිපත්

කිරීම ප්‍රේක්ෂකයන්ට අපූර්ව අත්දැකීමක් විය. හංගේරියානු ජාතික කලා ශිල්පිණියක වන විරාග් රේකා තූරි මහත්මිය විසින් ඔඩිසි නර්තනයක් ද ඉදිරිපත් කරන ලදී.

4. අධ්‍යාපනඥයන්, කලා ශිල්පීන්, සිසු සිසුවියන් සහ ඉන්දීය සහ ශ්‍රී ලංකා ප්‍රජාවේ සාමාජිකයන් රැසක් පරම්පරා ගණනාවකට අභාසය ලබා දෙන ශ්‍රේෂ්ඨ චරිතයක් වන රවීන්ද්‍රනාත් තාගෝර්තුමාට උපහාර පිදීම සඳහා මෙම උත්සවයට සහභාගී වූහ. ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය ශ්‍රී ලංකා තාගෝර් සමාජය සමඟ එක්ව ගුරුදේව් රවීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ ජනම දිනය සැමරීම තුළින් දෙරටට පොදු කලා සහ බුද්ධිමය උරුමය හරහා දෙරට සංස්කෘතීන් අතර සංවාදය සව්මත් කිරීමට ගන්නා ප්‍රයත්නයන් පිළිබිඹු වේ.

****

**කොළඹ**
***2025*** මැයි ***09***